# එළවළු වෙළෙඳ රටාවන්


ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල එළවළු පාරිභෝජනය දිනකට ග්‍රෑම් 93 කි. එය වාර්ෂිකව කිලෝ 39 ක් වේ. මේ අනුව දේශීය අවශ්‍යතාවය දිනකට මෙට්‍රික් ටොන් 1500 ක් පමණ වන අතර, කොළඹට පමණක් දිනකට එළවළු මෙට්‍රික් ටොන් 100 ක් පමණ අවශ්‍යය. මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හූමි ප්‍රමාණයෙන් 2% ක්, එනම් අක්කර ලක්ෂ 3 ක් පමණ එළවළු වගා කරනු ඇත. මෙමගින් වාර්ෂිකව මෙට්‍රික් ටොන් ලක්ෂ 6 ක් පමණ එළවළු ලැබේ.

ගෙදරක ආහාර ද්‍රව්‍ය සඳහා යන වියදමෙන් 10% ක් පමණ එළවළු සඳහා වැය කිරීමට ශ්‍රී ලාංකිකයින් පෙළඹී ඇත. මෙය මුළු ආදායමෙන් 6% ක් පමණ වන්නේය. ආදායමෙන් සෑහෙන ප්‍රමාණයක් එළවළු මිලදී ගැනීම සඳහා යෙදවීමට සිදුවන නිසා එළවළු මිල පවුලක ජීවන වියදම කෙරෙහි යම් බලපෑමක් ඇති කරනු ලබයි.

එළවළු මිල ඉහල පහල යෑම මෙරට ආර්ථික ප්‍රශ්ණයක් බවට පත්වී ඇති අතර මෙසේ ඉහල පහල යෑමට බලපාන ප්‍රධාන හේතුව නම් සෑම එළවළු වර්ගයකටම නිෂ්පාදන වාරයක් හා අවාරයක් තිබීමයි. එහෙත් මෙම නිසා එළවළු නිෂපාදනය අධික කාලයේදී ඉල්ලුමට වඩා වැඩි සැපයුමක් ඇති බැවින් මිල පහල යෑමක් සිදුවන අතර, එළවළු අවාරයේදී සැපයුම ඉල්ලුමට වඩා අඩු වෙන නිසා මිල ඉහල යෑමක් සිදුවෙයි.

අංක 1 සටහන

<u>තාලීන මිල දර්ශකය (එළවළු සඳහා)</u>



මෙමම දර්ශක අනුව එලවළු මිලෙහි ඉහල යන කාලයක් සහ පහල යන කාලයක් කැපී පෙනේ. උඩරට සහ පහතරට යන දෙවර්ග යෙහි එලවළු වල මිල ඉහල නැග ඇත්තේ ජූනි මාසයේදීය. එහිදී දර්ශකයේ අගය උඩරට එලවළු සඳහා 133·9 ක් වන අතර පහතරට එලවළු සඳහා 118·2 ක් වේ. එලවළු මිල පහත වැටී ඇත්තේ (උඩරට පහත රට දෙවර්ග යේම) සැප්තැම්බර් මාසයේදීය. එහිදී දර් ශක අගය උඩරට එලවළු සඳහා 82·5 ක් වන අතර පහත රට එලවළු සඳහා 92·6 ක් වේ. කොල එලවළු වර්ග ගත්විට (කන්කුන් මුකුණු වැන්න ආදිය) ඉහල මිලක් තීරණය වී ඇත් තේ දෙසැම්බර් මාසයේදීය. එහිදී දර්ශක අගය අගය 121.1 ක් වන අතර අඩුම මිලක් තීරණය වී ඇති නුනි මාසයේදී එහි අගය 90.7 දක්වා අඩුවී ඇත.

මෙම තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ එළ වළු මිල පෙබරවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා ඉහල නැග ජූනි මාසයේදී ඉහල මිල මට්ටම කරා ළඟාවේ. ඉන් පසුව පහතට වැටෙන මිල මට්ටම සැප්තැම්බර් මාසයේදී පහලම මට්ටමට ලඟාවේ.

එලවළු මිල ඉහල පහල යෑමට විශේෂිත වූ නොයෙක් හේතූන් බලපාන බව ඒ සම්බන්ධ විවිධ අංශ නොයෙක් විට පෙන්වා දෙති. මේ අනුව වැස්ස නියගය වැණි දේශගුණික කරුණු දේශපාලන තත්වය හා අලෙවි රටාවේ ඇති දුර්වලතා ආදිය මෙයට හේතු වශයෙන් සඳහන් වේ.

කෙසේ වෙතත් එලවළු මිල පහල බසින විට නිෂ්පාදකයින් විසින් වෙළෙන්දන් අඩු මිලට එලවළු මිලදී ගන්නා බව පවසයි.

එලවළු විකුණා ගැනීමට ඇති අපහසුව ගැන ඔවුන් කථා කරයි. නමුත් ඇත්ත තත්වය වන එලවළු නිෂ්පාදනය වැඩිවීම නිසා මිල පහල බසින බව පවසන්නේ කිහිප දෙනෙක් පමණි.

මෙරට එලවළු මිල ඉහල පහල යාමට බල පාන සත්‍යය කරුන වන්නේ සැපයුමෙහි සිදු වන ඉහල පහල යෑමයි. එනම් එලවළු වාරයක් සහ අවාරයක් දක්නට ලැබීමයි.

ආහාර ද්‍රව්‍යය වගා කරන යල සහ මහ ප්‍රධාන කන්න (වාර) දෙකක් හඳුනාගත හැකිය. අප්‍රේල් වලින් පසුව ආරම්භ වන යල් කන්නය සැප්තැම්බර් පමන වන විට අවසන් වේ. නොවැම්බර් මස දී පමණ ආරම්භ වන මහ කන්නය මාර්තු පමණ වන විට අවසන් වේ. මේ කන්න දෙක බෙදීමට බොහෝ විට මුල්වී ඇත්තේ දිවයිනට වර්ෂාව ලැබෙන ඊසාන දිග සහ නිරිත දිග මෝසම් සුලං කාලයන්ය.

**පර්යේෂන සහ පුහුණු කිරීමේ**

**නිලධාරි**

**බණ්ඩාර රත්නායක විසිනි**

මෙම ප්‍රධාන දෙකට අනුව එලවළු වගා කරන නිසා දිවයින පුරා එලවළු නිෂ්පාදනය වැඩි වෙන කාල දෙකකුත් අඩු වෙන කාල දෙකකුත් ඇතිවිය යුතුය. (වගා කටයුතු ආරම්භ කරන සමයේ නිෂ්පාදනයක් දක්නට නොමැති බැවින් නිෂ්පාදන ප්‍රමාණය අඩුවේ) නමුත් ප්‍රධාන වශයෙන් අපට හඳුනා ගත හැක්කේ මිල ඉහල නගින කාලයකුත් පහල බසින කාලයකුත් වශයෙන් කාල දෙකක් පමණි.

සැප්තැම්බර් මස වැසි ලැබීමත් සමග මහ කන්නය සඳහා එලවළු වගාව ආරම්භ කරයි. මෙමම කාලයේදී උඩරට එලවළු පහත රට එලවළු වර්ග මෙන්ම හේන් එලවළු වගාවද කෙරේ. මෙම වගා කටයුතු ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වාම සිදුවන අතර අස්වැන්න දෙසැම්බර් මාසයේ සිට නොකඩවා වෙළඳ

පොළට එයි. මහ කන්නයේ අස්වැන්න වැඩි වශයෙන් වෙළඳ පොළට එන්නේ ජනවාරි මාසයේදී වන අතර මෙය මුල් වැසි ලැබෙන කාලය අනුව බොහෝ විට ජනවාරි සහ පෙබරවාරි යන මාස දෙක තුළදී සිදු වෙයි. ඉන් පසුව පෙබරවාරි අග සිට, වෙළඳ පොළට ලැබෙන එළවළු ප්‍රමාණය අඩුවීමට පටන් ගනී.

යල් කන්නය සඳහා මෙරට බොහෝ ප්‍රදේශවල විශේෂයෙන්ම පහත රට ප්‍රදේශවල එළවළු වගාව නොකෙරේ. එයට ප්‍රධාන හේතුව වර්ෂාව නොමැතිව නියඟයේ බල පෑමෙන් එළවළු වගාවට හානි ඇතිවෙන නිසාය. හේන් එළවළු වගාව යල කන්නය සඳහා බොහෝවිට නොකෙරෙනු ඇත. පහත රට එළවළු වගාව බොහෝ විට දැකිය හැක්කේ ජල සම්පාදනය කෙරෙන ප්‍රදේශවල පමණි. වර්ෂාව මඳකම නිසා මෙම කන්නය සඳහා පහතරට ගොවීන් බඩ ඉරිඟු කව්පී මුංඇට වැනි භෝග වර්ග වගාව සඳහා තෝරා ගනිති.



උඩරට එළවළු ගොවියාගේ ක්‍රියාවන්ද මෙයට බොහෝ දුරට සමානය. උඩරට එළවළු වවන ප්‍රධාන ප්‍රදේශ දෙක වන නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක දෙක තුළ යල් කන්නය සඳහා එළවළු වගා කරන හැම්විල වී වගාවී කෙරේ. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ යල් කන්නයේ ඇති වන සුළඟක් නිසා එළවළු වගාවට ස්වභාවික හානි වීමයි.

එළවළු තොග ලැබීමත් සමගම මෙතෙක් ඉහළ නැගුන එළවළු මිල ගණන් පහළ වැටෙන්නට පටන් ගනී. මහනුවර සහ මාතලේ ප්‍රදේශවලින් ලැබෙන මෙම එළවළු තොග සැප්තැම්බර් දක්වාම නොනවත්වාම ලැබෙනු ඇත.

මෙම හේතුව නිසා උඩරට එළවළු සැපයුම සහ පහත රට එළවළු සැපයුම පෙබරවාරි මාසයෙන් පසුව දිගින් දිගටම ජූනි මාසය අවසානය දක්වාම පහළ වැටේ. මැයි ජූනි මාස වලදී ලැබෙන නිරිත දිග මෝසම් සුළං වැසි ආශ්‍රයෙන් යල් කන්නය සඳහා මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල එළවළු වගාව ආරම්භ කෙරේ. මෙම එළවළු වෙළඳ පොළට ලැබීම ආරම්භ වන්නේ ජූලි මාසයේ සිටය.

යල් කන්නය සඳහා වී වගා කල උඩරට (නුවරඑළිය සහ බදුල්ල) ගොවීන් අස්වැන්න කපා ගැනීමත් සමගම එම ඉඩම්වල එළවළු වගා කිරීමට පටන් ගනී. අගෝස්තු මසදී වගා කටයුතු නිම කෙරෙන මේවායෙහි නිෂ්පාදන තොග අගෝස්තු අග සිට වෙළඳපොළට ලැබීමට පටන් ගනී. සැප්තැම්බර් මාසයේදී මේවා විශාල වශයෙන් වෙළඳපොළට ලැබේ. යල් කන්නය සඳහා පහත රට ප්‍රදේශවල වගා කල එළවළු වලද අස්වැන්න මේ වන විට වෙළඳපොළට ලැබෙමින් පවතී. මෙම කාලය වන විට වෙළඳපොළට ලැබෙන විශාල තොග නිසා එළවළු මිල ශීඝ්‍රයෙන් පහළ වැටේ.

සැප්තැම්බර් අවසානයත් සමග මෙම ඵල වළු සැපයුම ක්‍රමයෙන් පහල බසින්නට පටන් ගනී. මෙහි ප්‍රතිඵලය නැවතත් ඵලවළු මිල ඉහල යාමයි. නමුත් දෙසැම්බර් මාසය පමන වන විට මහ කන්නයා සඳහා වගා කල පහත රට ඵලවළු වෙළඳ පොලට ලැබෙන නිසා මිල ඉහළ යාම ජූනි මාසයේ තරම් දුරකට සිදු නොවේ.

ප්‍රධාන වශයෙන් කාලගුණ හා ජ්‍යොතිෂ සාධක මගින් මෙරට ඵලවළු නිෂ්පාදනය නො කරන කාලය තීරණය කර ඇත. මින් එක් එක් කාරයේදී කෙරෙන නිෂ්පාදන ප්‍රමාණය අනුව මිල ඉහල පහල යෑම සිදුවේ. මෙයින් පාරිභෝගිකයාට මෙන්ම නිෂ්පාදකයාටද නොයෙක් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වනු නියතය. මේ සඳහා ගත හැකි එකම ක්‍රියා පිළිවෙත ඵලවළු මිලෙහි විචලනය අඩු කිරීමයි. ඒ සඳහා නිෂ්පාදනය වැඩි කාලයේ වෙළඳ පොලට ලැබෙන තොග ප්‍රමාණය සීමා කිරී මත්, නිෂ්පාදනය අඩු කාලයේ වෙළඳ පොලට ප්‍රමාණවත් අයුරින් ඵලවළු සැපයීමත් හැරුණු විට සළහැකි වෙනත් පිළියමක් නොමැත.

